කලාපය 04 2024

# Cyber Guardian

Publication for your online safety

Sri Lanka CERT|CC
Sri Lanka Computer Emergency Rediness Team
Coordination Centre

## ශ්‍රී ලංකා සර්ට් (Sri Lanka CERT) වෙතින් අනතුරු ඇඟවීමක්.

විවිධ බැංකු, වාණිජ ආයතන, අන්තර් ජාතික ආයතන නාමයන් භාවිතා කරමින් පරිත්‍යාග මුදල් තෑගි, දිනුම් වාසනා, රැකිරක්ෂා ලබාදීමට ලියාපදින්චිවන ලෙස දන්වමින් එවනු ලබන ව්‍යාජ පණිවුඩ වලින් ප්‍රවේසම් වන ලෙස ශ්‍රීලංකා සර්ට් **(Sri Lanka CERT)** ආයතනය මහජනතාවගෙන් ඉල්ලාසිටියි.අනුකාරක **(Fake web)** වෙබ් අඩවි, සමාජ මාධ්‍ය**(Social Media)** වේදිකාවන්, **SMS**, **WhatsApp**, හරහා එවනු ලබන පණිවුඩ මගින් මෙම සයිබර් ජාවාරම් කරුවන් ඔබ හා සම්බන්ද වීමට උත්සහ දරනු ඇත. ඔවුන් විසින් ලබාදෙන **links** වෙත පිවිසීමෙන් ඊට සම්බන්ධවන පුද්ගලයන්ගේ පරිගණක ජංගම දුරකථන වල ඇති දත්ත සොරා ගැනීමෙන් විවිධ අපචාර සදහා මෙන්ම මුදල් වංචා ද සිදුකරනු ලබයි.

මෙවැනි අපරාධ මෑත කාලයේ වැඩිවෙමින් පවතින අතර එම අපරාධවලට ගොදුරුවන්නන්ගේ ප්‍රමාණයද වැඩිවෙමින් පවතින බව ශ්‍රී ලංකා සර්ට් ආයතනය පවසයි. තවද විවිධ ජාතික හා




ආගමික උත්සව මුල් කරගනිමින් මෙම වංචාකරුවන් කටයුතු කරනු දක්නට ලැබේ. ශ්‍රී ලංකා සර්ට් ආයතනය ඇතුළු විවිධ සංවිධාන මෙම සයිබර් වංචාවන් පිලිබඳ පුළුල් දැනුවත් කිරීමේ ප්‍රචාරණයක් දියත් කොට ඇත. නොදැනුවත් භාවය හා නොසලකා හැරීම නිසා මෙම අපරාධවලට ගොදුරු වන්නන්ගේ පැමිණිලි දිනපතා වැඩිවෙමින් පවතී. සැකසහිත අන්තර්ජාල හා සමාජ මාධ්‍ය පණිවුඩ ලැබුන හොත් ඒවාට පිවිසීමට පෙර අදාළ ආයතන වල නිල වෙබ් අඩවි වලට පිවිසීමෙන් හෝ නිල දුරකථන අංක ඔස්සේ හෝ කරුණු විමසා සහතික කරගන්නා ලෙස ශ්‍රී ලංකා සර්ට් ආයතනය මහජනතාවගෙ න් ඉල්ලාසිටියි. එසේ සහතික කරගත නොහැකි පණිවුඩ විවෘත කිරීමෙන් වලකින ලෙස හෝ නොසලකා හරින ලෙස ශ්‍රීලංකා සර්ට් ආයතනය තවදුරටත් මහජනතාව ගෙන් ඉල්ලා සිටියි.

## ඔබත් eSports වලට ඇබ්බැහි වුවෙක් නම් ප්‍රවේසමෙන්

ඔබත් **eSports** වලට ඇබ්බැහි වුවෙක්ද? එසේත් නොමැතිනම් ක්‍රීඩාවක් ලෙස **Online Gaming** වල නිරතවන්නෙක්ද ? කෙසේ වෙතත් ඔබ ඉන් ලකුණු රැස් කරනවා සේම සයිබර් ආරක්ෂාව ගැනද සිතිය යුතුව තිබේ. ආරක්ෂිතව සිටීම සඳහා මෙම ඉඟි ඔබට උපකාරීවනු ඇත.



### 1. ජයග්‍රහණය සඳහා ශක්තිමත් Password!.

ජයග්‍රාහකයින් දිගු සංකීර්ණ සහ ශක්තිමත් මුරපද භාවිතා කරයි. ශක්තිමත්ම මුරපද අවම වශයෙන් අක්ෂර 12 ක් දිග වන අතර අකුරු අංක සහ සංකේත ඊට ඇතුළත් වේ. එක් එක් සබැඳි ගිණුම සඳහා  අනන්‍ය මුරපදයක් තිබිය යුතුය. මුරපද රැසක් මතක තබා ගැනීම අපහසුනම් - බොහෝ ස්මාර්ට්ෆෝන් සහ වෙබ් බ්‍රව්සර්වල අඩංගු **password manager** සේවාවක් ලබාගැනීම සුදුසුයි.

### 2. ඔබේ Game එක ගැන දැනගන්න.

ඔබගේ ජංගම දුරකථනයේ ඇති ඕනෑම නව ක්‍රීඩා යෙදුමක් **(App)** බාගතකර ගැනීමට පෙර එය නීත්‍යානුකූල බව සහතික කර ගන්න. බාගත කිරීමට පෙර ඒ පිලිබඳ ඇති සමාලෝචන පරීක්ෂා කරන්න.

### 3. බහු-සාධක සත්‍යාපනය (MFA).

බහු-සාධක සත්‍යාපනය (**MFA**), ඔබේ ගිණුම්වලට අමතර ආරක්ෂාවක් එක් කරයි දැන් සමහර ක්‍රීඩා සහ ක්‍රීඩා පද්ධති **MFA** සඳහා ඉඩ ලබා දේ. සෑම විටම **MFA** භාවිතා කිරීමට අපි නිර්දේශ කරමු.

### 4. යාවත්කාලීනකිරීම් ස්වයංක්‍රීය කරන්න.

ඔබගේ ක්‍රීඩා සදහා යොදා ගන්නා ජංගම දුරකථන හෝ පරිගණක දෘඩාංග සහ මෘදුකාංග හැකිතාක් යාවත්කාලීනව තබා ගැනීමට සැලකිලිමත්වන්න. ඒ සදහා ස්වයංක්‍රීය යාවත්කාලීන මෘදුකාංග ලබාගත හැකියි.

### 5. ගොදුරක් නොවන්න.

සයිබර් අපරාධකරුවන් **Cybercriminals** බොහෝ විට ක්‍රීඩකයින් හා නිරන්තරයෙන් සබැඳි **Click** කිරීමට හෝ අනිෂ්ට ගොනු බාගත කිරීමට පොලඹවීමෙන් වංචා හෝ හැක් කිරීම් සිදුකරයි. මෙය **phishing** ලෙස හැඳින්වේ. සබැඳි මත ක්ලික් කිරීමෙන් හෝ නාඳුනන අයගෙන් එන හෝ ඔබ අපේක්ෂා නොකළ ඕනෑම දෙයක් බාගත කිරීමෙදී ප්‍රවේශම් වන්න. ක්ලික් කිරීමට පෙර එය සත්‍යාපනය කරන්න.

### 6. Debit නොව Credit.

ක්‍රීඩා පද්ධතියකට ඔබේ ගිණුමට නිශ්චිත ගෙවීමේ ක්‍රමයක් සම්බන්ධ කිරීමට අවශ්‍ය නම්, **Debit** කාඩ්පතකට වඩා **Credit** කාඩ්පතක් තෝරන්න. **Credit** කාඩ්පත් **Debit** කාඩ්පත්වලට වඩා වැඩි පාරිභෝගික ආරක්ෂාවක් සැපයෙන අතර වංචාවකදී ඔබේ මුදල් ආපසු ලබා ගැනීමට ඔබට හොඳ අවස්ථාවක් තිබේ.

### 7. ප්‍රවේශමෙන් Share කරන්න.

ඔබ වැඩි වැඩියෙන් තොරතුරු පළ කරන තරමට, අපරාධකරුවෙකුට ඔබේ අනන්‍යතාවය සොරකම් කිරීමට, ඔබේ දත්තවලට ප්‍රවේශ වීමට හෝ ලුහුබැඳීම වැනි වෙනත් අපරාධ කිරීමට එම තොරතුරු භාවිතා කිරීම පහසු විය හැකිය. ක්‍රීඩා ගිණුම් පැතිකඩවල ඔබ කොපමණ පුද්ගලික තොරතුරු සපයනවාද යන්න ගැන සිතන්න. තවද මෙම තොරතුරු බෙදා ගැනීමට නාඳුනන අයෙකු ඔබෙන් ඉල්ලා සිටියහොත්, එය ප්‍රතික්ෂේප කරන්න.

### 8. වෙස්වළා ගත් ක්‍රීඩාවක්.

ඔබ නොදන්නා අය සමඟ ක්‍රීඩා කිරීමේදී ඔවුන්ට ඔබේ සැබෑ නම හෝ වෙනත් පුද්ගලික තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නැත, ඔවුන්ට අවශ්‍ය වන්නේ ඔබ ක්‍රීඩාවේදී කෙතරම් දක්ෂද යන්න සොයා බැලීමයි. එනිසා ආරක්ෂිත ක්‍රීඩා නාමයක් භාවිතා කරන්න. ඔබගේ සැබෑ ඡායාරූපය වෙනුවට **Avatar** එකක් භාවිතා කරන්න. නාඳුනන කෙනෙකු ඔබෙන් ඡායාරූපයක් බෙදා ගැනීමට හෝ ඔබේ වෙබ් කැමරාව ක්‍රියාත්මක කිරීමට ඉල්ලා සිටින්නේ නම්, ප්‍රතික්ෂේප කරන්න. ඔවුන්ට සෙල්ලම් කිරීමට මිස ඔබව දැකීමට අවශ්‍ය නැත.

### 9. කරදර කාරී ක්‍රීඩාකයන්ගෙන් ඈත්වන්න.

වෙනත් ක්‍රීඩකයෙකු ඔබට අපහසුතාවයක් ඇති කරන්නේ නම්, ඔවුන්ව අවහිර කරන්න. විශ්වාසවන්ත වැඩිහිටියෙකුට කියන්න. ක්‍රීඩකයෙකු හිරිහැර කරන්නෙකු නම් හෝ වෙනත් ආකාරයකින් ඔබව අපහසුතාවයට පත් කරන්නේ නම් ඔබට ඔහුව ක්‍රීඩාවෙන් ඉවත් කළ හැකි බව මතක තබා ගන්න. අන්තර්ජාලයේ ඇති සිත් රිදවන අදහස් ඔබේ මානසික සෞඛ්‍යයට සැබෑ බලපෑමක් ඇති කළ හැකිය. සිතවුල් ඇත්නම් වැඩිහිටියකුට කියන්න.

### 10. ඔබගේ සැකසීම් පරීක්ෂා කරන්න.

ඔබ නව ක්‍රීඩා කොන්සෝලයක් ලබා ගත් වහාම හෝ නව ක්‍රීඩාවක් උත්සාහ කළ වහාම එහි රහස්‍යතා සහ ආරක්ෂක සැකසුම් සකසා ගන්න. ඔබට බෙදා ගැනීමට පහසු වන්නේ කුමන ආකාරයේ දත්තදැයි සිතා බලන්න.

## Pictuer Story

## ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC)





**ජාතික සයිබර් ආරක්ෂණ මෙහෙයුම් මධ්‍යස්ථානය (NCSOC) පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා CERT සමඟ V S Information Systems (Pvt) Ltd සහ Dialog Broadband Network ආයතන එක්වේ.**

## Our Services

## ආරක්ෂිත ජාලය සහ මේඝ (Cloud) යටිතල පහසුකම්



ඔබගේ ඩිජිටල් වත්කම්වල උපරිම ආරක්ෂාව සහතික කරනු පිණිස ඔබගේ නෙට්වොර්ක් සහ ක්ලවුඩ් (**Cloud**) යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා අපි ඇප කැපවී සිටිමු. අවදානම් හඳුනා ගැනීම සඳහාත් ඒවා ඵලදායී ලෙස විසඳුම් ලබා දීමේ අරමුණින් ගැළපෙන විසඳුම් සැලසුම් කිරීම සඳහාත් පුළුල් ආරක්ෂණ තක්සේරුවක් අපි ඔබට ලබා දෙන්නෙමු.

ශක්තිමත් සත්‍යාපනය සහ ප්‍රවේශ පාලන යාන්ත්‍රණ, පරිවර්තිත දත්ත සම්ප්‍රේෂණය සහ **Real-Time** තර්ජන හඳුනාගැනීමේ පද්ධති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අපගේ කාර්ය මණ්ඩලය ප්‍රවීණත්වය ලබා සිටී. එමෙන්ම අපි විශිෂ්ට පරිචයන් කෙරෙහි අවධානය යොමු කරමින්, අනවසර ප්‍රවේශයන් සහ දත්ත උල්ලංඝනය කිරීම් වළක්වා ගැනීම සඳහා ෆයර්වෝල, රවුටර සහ ක්ලවුඩ් (**Cloud**) ආරක්ෂණ සේවා වින්‍යාස කර අධීක්ෂණය කරන්නෙමු. අප සමග හවුල්කාරීත්වය ගොඩනගා ගැනීම තුළින් ඔබේ ජාලය සහ ක්ලවුඩ (**network & cloud**) යටිතල පහසුකම්වලට එල්ල විය හැකි සයිබර් තර්ජනවලට එරෙහිව ඒවා ආරක්ෂා කර ඇති බවට විශ්වාසය ගොඩනගා ගැනීමට ඔබට හැකි වනු ඇත. එමගින් ඔබේ ව්‍යාපාරික කටයුතු විශ්වසනීයත්වයෙන් සහ සැහැල්ලු මනසකින් පවත්වා ගෙන යාමට ඔබට හැකි වනු ඇත.මේ සම්බන්ධයෙන් අප ආයතනය මගින් ලබාදෙන සේවා වන් පහත සදහන් වේ.

- **අභ්‍යන්තර සහ බාහිර ජාලවල ආරක්ෂක සමාලෝචනය කිරීම**
- **ක්ලවුඩ (cloud) ආරක්ෂක සමාලෝචනය**
- **රැහැන් රහිත ජාල ආරක්ෂණය පිළිබඳ සමාලෝචනය**
- **ජාල සැලසුම් විශ්ලේෂණය**
- **Firewall උපාංගහි විශ්ලේෂණයන්**
- **රවුටර සහ ස්විචයන්හි වින්‍යාස සමාලෝචන**
- **ප්‍රධාන පරිගණක මෙහෙයුම් පද්ධති (OS) සදහා වින්‍යාස සමාලෝචනය**
- **දත්ත මධ්‍යස්ථානවල භෞතික ආරක්ෂාව පිළිබඳ සමාලෝචනය**